## 2023 ජනවාරි මාසයට අදාලව 2023.01.05 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2023.01.05
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.
**සහභාගිත්වය** -

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 11. ඩී.එම්. කරුණාවතී මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 12. ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රීණී |
| 13. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14. ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 16. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හෙබ වීය.2022.12.20 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.12.30 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින් සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2022.12.20 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

### 02. මූලාසනය විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

කිසිවක් ඉදිරිපත් වී නැත.

### 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

**ගරු මන්ත්‍රි කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා**

බිබිල,වැගම,ශ්‍රී ධම්මපාල මාවත,මුවන්නේ ගොඩවත්තේ ලිපිනයේ පදිංචි ඊ.එච්.එම්.රත්නායක මහතා විසින් වැගම උතුර ග්‍රාම නිලධාරි වසමේ වැගම ශ්‍රී ධම්මපාල මාවතේ පරගහලන්ද වැව

අසල තමාගේ නිවස දක්වා ඇති මාර්ගය අබලන් වී මාර්ගයේ වතුර බැස යන ස්ථාන 02ක් ඇති බැවින් ඒ සඳහා බෝක්කු හතරක් ලබා දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපි ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

**ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා**

බිබිල,පිටකුඹුර,මල්දම් අඹේ,8 කණුව ලිපිනයේ පදිංචි ජේ.පී.ජී.ගාමිණි ජයසිංහ මහතා විසින් 103 නිල්ගල ග්‍රාම නිලධාරි වසමේ 8 කණුව මල්දම් අඹේ ගම්මානය මැදින් ඇති මාර්ග පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර තිබූ ලිපිය එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

## 04.යථාපරිදි කල්දි ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නැත.

## 05.යථාපරිදි කල්දි ඇති යෝජනා.

### 05.01.ගරු මූලාසනයේ යෝජනා.

### 05.01.01. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් PF - 7391 අංක දරණ කැබ් රථය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ කැබ් රථයේ කි.මී 300000 පසු කර ධාවනය කිරීමට අදාල අලුත්වැඩියා හා වාර සේවාව සිදු කිරීමට අවශ්‍යව ඇත. ඒ අනුව ඉහත කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා පළාත් යාන්ත්‍රික කාර්මික නිලධාරී විසින් ලබා දුන් නිර්දේශය අනුව සිදු කිරීම සඳහා නියෝජිත ආයතනයෙන් ලබා ගත් ඇස්තමේන්තු වටිනාකම් පහත පරිදි වේ.

| Estimate No | Service Description | Price (Rs.) |
|---|---|---|
| 7100056298 | Timing belt replacement & Timing belt assy | Rs. 286860.89 |
| 7100056311 | Service ,washing body & U/C Vacuum Cleaning | Rs. 79158.03 |
| **TOTAL** | | **Rs. 366018.92** |

ඒ අනුව මෙම කැබ් රථය අලුත්වැඩියා කිරීමටත් ඒ සඳහා වැය වන රු.366,018.92ක මුදල සභා අරමුදලින් දැරීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### 05.01.02. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA – 5164 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මේ වන විට JSB TRADING (PVT) LTD ආයතනය වෙත යොමු කර ඇත. ඒ අනුව ඉහත යන්ත්‍රය අලුත්වැඩියා

කිරීම සඳහා පළාත් යාන්ත්‍රික කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් ලබා දුන් නිර්දේශය මෙන්ම මිල සාධාරණීයකරන වාර්තාවට අනුව පහත සඳහන් ලෙස මුදල් වැයවේ.

| බිල් අංකය | සේවා විස්තරය | මුදල(රු.) |
|---|---|---|
| JSB/SR/22/150 | To supply Cabin safety glass(rear LHS) & sealing rubber | රු.113400.00 |
| JSB/SR/22/146 | For 1000H Service | රු.247100.00 |
| JSB/SR/22/152 | For Repair Out trigger Pads (Upper,Lower) | රු.189900.00 |
| JSB/SR/22/144 | For Engine Repair | රු.145090.00 |
| | Machine Transport Chargers | රු.270000.00 |
| **TOTAL** | | **රු.965490.00** |

ඒ අනුව බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියාව කිරීමටත් ඒ සඳහා වැය වන රු. 965490.00ක මුදල සභා අරමුදලින් දැරීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.03. අංක 17 දරණ එළවළු වෙළඳ පොල කඩකාමරය පවරා දීම සම්බන්ධවයි.</u>

බිබිල, කිවුලපිටලන්ද,"අනුර කැළුම්" ලිපිනයේ පදිංචි ඒ.එම්.ඇග්නස් පෙරේරා මහත්මිය විසින් අංක 17 දරණ එළවළු වෙළඳපල කඩකාමර පවත්වාගෙන යනු ලබන අතර පෞද්ගලික හේතුවක් නිසා එම කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල, කිවුලපිටලන්ද,"අනුර කැළුම්" ලිපිනයේ පදිංචි තමාගේ පුතා වන ඩී.එච්.තිලංක රුමේෂ් මහතා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඩී.එච්.තිලංක රුමේෂ් මහතා විසින් එම අංක 17 දරණ එළවළු කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.04. අංක 16 දරණ එළවළු වෙළඳ පොල කඩකාමරය පවරා දීම සම්බන්ධවයි.</u>

බිබිල, කිවුලපිටලන්ද,"අනුර කැළුම්" ලිපිනයේ පදිංචි ඒ.එම්.ඇග්නස් පෙරේරා මහත්මිය විසින් අංක 16 දරණ එළවළු වෙළඳපල කඩකාමර පවත්වාගෙන යනු ලබන අතර පෞද්ගලික හේතුවක් නිසා එම කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල, කිවුලපිටලන්ද,"අනුර කැළුම්" ලිපිනයේ පදිංචි තමාගේ දියණිය වන ඩී.එච්.කල්පනී අනුරාධා

මහත්මිය වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඩී.එච්.කල්පනී අනුරාධා මහත්මිය විසින් එම අංක 16 දරණ එළවළු කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05. බිබිල පොදු වෙළඳපල අංක බී 22 දරණ කඩ කාමරය පවරා දීම සම්බන්ධවයි.

බිබිල, රදලියද්ද,39 කණුව ලිපිනයේ පදිංචි ඩී.එම්.සිසිර දිසානායක මහතා විසින් බිබිල පොදු වෙළඳපල අංක බී 22 දරණ කඩ කාමරය පවත්වාගෙන යනු ලබන අතර පෞද්ගලික හේතුවක් නිසා එම කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල, අඹගොල්ල,මල්ලැහැගොඩ වත්ත ලිපිනයේ පදිංචි එම්.එම්.මල්ලිකා හේරත් මිය වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම්.එම්.මල්ලිකා හේරත් මිය විසින් බිබිල පොදු වෙළඳපල අංක බී 22 දරණ කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් RV – 8718 අංක දරණ ටේලරය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ ටේලරයේ තට්ටුවේ තහඩු දිරාපත්වීම හා වැසියේ කොටස් දිරාපත්ව ඇති බව රියදුරු විසින් ලිඛිතව දන්වා ඇත.ඒ අනුව ඉහත ටේලරය අලුත්වැඩියා කිරීම සඳහා පළාත් යාන්ත්‍රික කාර්මික නිලධාරී විසින් ලබා දුන් නිර්දේශය අනුව සිදු කිරීම සඳහා ආයතන 03 කින් ලබා ගත් ඇස්තමේන්තු වටිනාකම් අනුව අවම මිල ගණන වන රු.110150.00 ක් වැයවේ. ඒ අනුව ටේලරය අලුත්වැඩියාව සිදු කිරීමත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA – 5164 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මේ වන විට JSB TRADING (PVT) LTD ආයතනය වෙත යොමු කර ඇත. ඒ අනුව ඉහත යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා පළාත් යාන්ත්‍රික කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් ලබා දුන් නිර්දේශය අනුව සිදු කිරීම සඳහා පහත සඳහන් ලෙස මුදල් වැයවේ. (මෙම කොටස සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ පසුව අනුමැතිය ලබාදීම හේතුවෙන් අවස්ථා දෙකකදී යෝජනා ඉදිරිපත් කර ඇත.)

| බිල් අංකය | සේවා විස්තරය | මුදල(රු.) |
|---|---|---|
| JSB/SR/22/151 | To repair & Painting charges of Mud Guard & Cabin top Cover Machine | රු.65000.00 |

ඒ අනුව බැකෝ ලෝඩර් යන්ත්‍රය අලුත්වැඩියාව කිරීමටත් ඒ සඳහා වැය වන රු. 65000.00ක මුදල සභා අරමුදලින් දැරීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ගලි බවුසරයේ පොම්පය අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ගලි බවුසරයේ පොම්පය නඩත්තු කිරීමට හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා එහි නියෝජිත ආයතනය මඟින් ඇස්තමේන්තු ලබා ගන්නා ලදී. ඒ අනුව ගලි බවුසරයේ පොම්පය අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා රු.167941.65 ක මුදලක් වැයවේ. මෙම අලුත්වැඩියාව සඳහා ඉහත මිල ගණන් යටතේ මිල සාධාරණීකරන වාර්ථාවද ලබාගෙන ඇති අතර දිනෙන් දින මිල ගණන් වෙනස් වන බැවින් මෙම කටයුතු කඩිනමින් සිදු කර ගැනීම සඳහා අවශ්‍ය බැවින් ගලි බවුසරයේ පොම්පය අලුත්වැඩියා හා නඩත්තු කටයුතු කිරීම සිදු කිරීම සුදුසු බවත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සියලු වාහන හා යන්ත්‍ර සූත්‍ර ගාල් කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර ගාල් කිරීම සඳහා භාවිතා කල රථගාල මේ වන විට ඉවත් කර ඇති බැවින් සියලුම වාහන හා යන්ත්‍ර සූත්‍ර වැස්සට නිරාවරනය වීම සිදුවේ. මේ වන විට වාහන වල රියදුරු වහල හා ට්‍රැක්ටර් ට්‍රේලර් සියල්ල දිරාපත්ව ඇති අතර, මෙසේ

දිගින් දිගටම වාහන හා යන්ත්‍ර සූත්‍ර වැස්සට නිරාවරනව තිබීම හේතුවෙන් ඒවා අලුත්වැඩියා කිරීම සඳහා විශාල වියදමක් දැරීමට සිදුවේ. එබැවින් මේ පිළිබඳව සලකා බලා සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර සූත්‍ර ගාල් කිරීම සඳහා කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

එහි දී රේවත මාවත හා බදුල්ල මඩකලපුව ප්‍රධාන මාර්ගය ඒකාබද්ධ කල මාර්ගයේ සකස් කර තිබූ රථගාලෙන් ගලවා ඉවත් කල වහලය ඉක්මනින් වාහන සේවා මධ්‍යස්ථානයේ සවි කල යුතු බවත් මෙය කොන්ත්‍රාත් ගත් කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම 2022.12.31 දිනෙන් අවසන් වන බැවින් සමිතිවලට හෝ බාර දී නිල නිවාස, හෙළ බොජුන්හල හා වාහන සේවා මධ්‍යස්ථානයේ වැඩ කඩිනමින් සිදු කිරීම සුදුසු බවත් සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර සූත්‍ර එහි ගාල් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර වැඩ ආරම්භ කිරිම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

රේවත මාවත හා බදුල්ල මඩකලපුව ප්‍රධාන මාර්ගය ඒකාබද්ධ කල මාර්ගයේ සකස් කර තිබූ රථගාලෙන් ගලවා ඉවත් කල වහලය ඉක්මනින් වාහන සේවා මධ්‍යස්ථානයේ සවි කල යුතු බවත් මෙය කොන්ත්‍රාත් ගත් කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම 2022.12.31 දිනෙන් අවසන් වන බැවින් සමිතිවලට හෝ බාර දී නිල නිවාස, හෙළ බොජුන්හල හා වාහන සේවා මධ්‍යස්ථානයේ වැඩ කඩිනමින් සිදු කිරීම සුදුසු බවත් සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර සූත්‍ර එහි ගාල් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර වැඩ ආරම්භ කිරිම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සියලු වාහන හා යන්ත්‍ර සූත්‍ර රක්ෂණය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර රක්ෂණය කිරීම සඳහා ප්‍රසම්පාදනය අනුගමනය කල යුතුව ඇත. නමුත් මෙම වාහන හා යන්ත්‍ර සූත්‍ර දීර්ඝ කාලයක් තක්සේරු කර නොමැති අතර මේ දක්වා රක්ෂණ සමාගම විසින් කරනු ලබන රක්ෂිත වටිනාකම අනුව රක්ෂණය කිරීමට කටයුතු කර ඇත. තක්සේරු කිරීම සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත ලිපි යොමු කලද වාහන තක්සේරු කිරීම සිදු කිරීමට කටයුතු කර නොමැත. එබැවින් සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර රක්ෂණය කිරීම සඳහා ප්‍රසම්පාදනය මඟින් අවම මිල ගණන් යටතේ තෝරාගත් රක්ෂණ සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන තක්සේරු වටිනාකම අනුව 2023/2024 වර්ෂ සඳහා රක්ෂණය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.11. නඩු ගාස්තු ගෙවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.**

මොණරාගල මහාධිකරණයේ විභාග කරන ලද පහත නඩු කටයුතු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ටී.යූ.එස්.කේ.බණ්ඩාර මහතාගේ සේවය සඳහා අදාළ නඩු ගාස්තු ගෙවීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. එම්.6799 කේ.එච්.තිළිණ නිරෝෂණ මයා - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්
02. එම්.6800 කේ.එච්.තිලක් ජයසිරි මයා - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්
03. එම්.6801 කේ.එච්.මධුමාල් චින්තක මයා - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්
04. එම්.6802 ඩී.එම්.නිලන්ත චාමර මයා - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්
05. එම්.6803 ඩී.එම්.නිලන්ත චාමර මයා - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්
06. එම්.6804 කේ.එච්.තිලක් ජයසිරි මයා - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්
07. රිට්.04/2022 කේ.ඩී.මිතිලා දීප්ති කරුණාසුන්දර මිය - කඩ කාමර පවරා ගැනීමට එරෙහිව සභාවට විරුද්ධව නඩු පැවරීම
08.රිට්.03/2022 ඒ.එම්.ශාන්ත කුමාර මයා - කඩ කාමර පවරා ගැනීමට එරෙහිව සභාවට විරුද්ධව නඩු පැවරීම
09. රිට් 01/2021 මොහොම්මදු කාසිම් සිත්ති නිහාරා - කඩ කාමර පවරා ගැනීමට එරෙහිව සභාවට විරුද්ධව නඩු පැවරීම
10.රිට් 02/2021 හසීම් අබ්දුල් හසාන් - කඩ කාමර පවරා ගැනීමට එරෙහිව සභාවට විරුද්ධව නඩු පැවරීම
11.රිට්03/2021 ඒ.එම් විමලාවතී - කඩ කාමර පවරා ගැනීමට එරෙහිව සභාවට විරුද්ධව නඩු පැවරීම
12.එම්.5875 ඩී.එම්.ආනන්ද - කඩ කුලී මුදල් නොගෙවීම හේතුවෙන්

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.12. පරිවර්තිත ගමන් වියදම් ලබා ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු , ජල බිල්පත් හා ගාස්තු,කඩකුලී,ව්‍යාපාර බදු ලබා ගැනීම සඳහා ක්ෂේත්‍රයට ගොස් මුදල් එකතු කිරිමට හා බිල්පත් නිකුත් කිරිමට සිදුවේ.ඒ සඳහා බිබිල ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක මහතුන් ප්‍රමාණවත් නොවන නිසා පහත සඳහන් පරිදි වෙනත් ක්ෂේත්‍රවල නිලධාරින් ඒ සඳහා යොදවා ඇත.

<u>වරිපනම් බදු</u>

එම්.ඒ.රුවන් මිහිරංග මයා - ආදේශක යන්ත්‍ර සහායක

ඩබ්.එම්.කරුණාතිලක මයා - මුරකරු

<u>ජල</u>

කෝසල හිමරත්න මයා - ක්ෂේත්‍ර කම්කරු

<u>ව්‍යාපාර බදු හා කඩකුලී</u>

ලලිත් ප්‍රියශාන්ත මයා - ආදේශක මුරකරු

උක්ත නම් සඳහන් අයවලුන් ක්ෂේත්‍රයට ගොස් මුදල් එකතු කිරීමේදී බිබිල බදුල්ල පාරේ යල්කුඹුර දක්වාත්,මොනරාගල පාරේ කණුල්වෙල දක්වාත්,මඩකලපුව පාරේ අඹගොල්ල හංදිය දක්වාත්,මහියංගන පාරේ 1 කණුව හා ඉසුරු උයන දක්වාත්,පිටකුඹුර පාරේ මොලන්දෙනිය දක්වාත් යනාදි සියළුම මාර්ග වල පටුමග වලද ගමන් කිරිමට සිදුවේ. මෙම බදු එකතු කිරිමට එම නිලධාරින්ගේ පෞද්ගලික වාහන යොදා ගන්නා බැවින් ඉන්ධන ලබා ගැනීමේදී ඔවුන් මහත් අපහසුතාවයට පත්වන බව අප හට දැනුම් දෙන ලදී. ඒ අනුව ඒ අයගේ ඉල්ලීම සාධාරණ බැවින් පරිවර්තිත ගමන් වියදම් වශයෙන් එක් නිලධාරියකුට මසකට උපරිම රු.1000.00 බැගින් ගෙවීම පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා යොමු කර අනුමැතිය ලබා දීමෙන් පසු ගෙවීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා යොමු කර අනුමැතිය ලබා දීමෙන් පසු ගෙවීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.13. RB – 4989 අංක දරණ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ඉහත අංක දරණ ට්‍රැක්ටරය මේ වන විට චන්ද්‍රා මෝටර්ස් ආයතනයට අලුත්වැඩියාව සඳහා යොමු කර ඇත. ඒ අනුව අලුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම සඳහා ලබා ගත් මිල ගණන මිළ සාධාරණ වාර්ථාව අනුව රු.73930.00 ක්ද අලුත්වැඩියාව සඳහා වැඩ කුලියද මිළ සාධාරණ වාර්ථාවට අනුව රු.60000.00 වූ පසු මෙම අලුත්වැඩියාව සඳහා වැය වන මුළු මුදල රු.133930.00 වේ. ඒ අනුව ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීමත් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.14. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් 67 - 1724 අංක දරණ ටේලරය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ ටේලරයේ තට්ටුවේ දෙපස තහඩු දිරාපත්වීම හා වැසියේ කොටස් දිරාපත්ව ඇති බව රියදුරු විසින් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ඉහත ටේලරය අලුත්වැඩියා කිරීම සඳහා පළාත් යාන්ත්‍රික ඒකකයේ කාර්මික නිලධාරී විසින් ලබා දුන් නිර්දේශය අනුව සිදු කිරීම සඳහා ආයතන කිහිපයක් කින් ලබා ගත් ඇස්තමේන්තු වටිනාකම් අනුව අවම මිල ගණන වන රු.438300.00 ක් වැයවේ.ඒ අනුව ටේලරය අලුත්වැඩියා කිරිමටත් ඒ සඳහා වැය වන මුදල් සභා අරමුදලින් දැරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.15. 2022 දෙසැම්බර් මස 20 වන දින අංක 05.01.20 දරණ සභා තීරණය සම්බන්ධ වාර්තාවයි.

ඒ අනුව ආදායම් පරික්ෂක එම්.එම්.අබේරත්න මයා හා ආදායම් පරික්ෂක එච්.එම්.ජයරත්න බංඩාර මහතා එක්ව දුන් වාර්තාව පහත දැක්වේ. "Covid-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වර්ෂයේ හා 2021 වර්ෂයේ දිවයිනටම බල පැවැත්වෙන පරිදි රජයේ නිවාඩු හා ඇඳිරි නීතිය පනවා තිබූ හෙයින් අදාල රාජකාරි කටයුතු කිරිමට තිබූ ඉඩකඩ ඉතා සීමිත විය. 2020 වර්ෂයේ මෙම කොවිඩ් වසංගතය නිසා රජයේ මෙහෙය වීම මත ප්‍රාදේශීය සභාව හරහා සහන මිලට ආහාර ද්‍රව්‍ය ගමින් ගමට ගොස් අලෙවි කිරිම සිදු කරන ලදී. මෙවැනි තත්වයන් මත මෙම දැන්වීම් පුවරුවලින් ගාස්තු අය කිරිමට අදාල ආයතන වසා තිබූ බව වාර්තා කර සිටින්නෙමු. ඒ අනුව 2020 වර්ෂයේ මාර්තු මස 16 වන දින සිට 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දින දක්වා රජයේ නිවාඩු,ඇඳිරි නිතිය හා සංවරණ සිමා පනවා තිබීම හේතුවෙන් අදාල දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකිරිමට නොහැකි වූ බව වාර්තා කරන්නෙමු." මෙම වාර්තාව සලකා බලා දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ආදායම් පරික්ෂකවරුන්ගේ වාර්තා අනුව, 2020 වර්ෂයේ මාර්තු මස 16 වන දින සිට 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දින දක්වා රජයේ නිවාඩු,ඇඳිරි නිතිය හා සංවරණ සිමා පනවා තිබීම හේතුවෙන් රටතුල සමස්ත ජනතාවම ඉතාමත් අසරණව සිටි අවධියක් බැවින් සියළු ජනතාවට සහන සැලසිම මහජන නියෝජිතයින් වශයෙන් අපගේ යුතුකමක් හා වගකිමක් බැවින් 2020 හා 2021 වර්ෂවලට අදාල දැන්වීම් පුවරුවලින් ගාස්තු නිදහස් කිරිම

සුදුසු බවත් එය කොමසාරිස්තුමා මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ආදායම් පරීක්ෂකවරුන්ගේ වාර්තා අනුව, 2020 වර්ෂයේ මාර්තු මස 16 වන දින සිට 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දින දක්වා රජයේ නිවාඩු,ඇඳිරි නීතිය හා සංචරණ සීමා පනවා තිබීම හේතුවෙන් අදාල දැන්වීම් පුවරුවලින් ගාස්තු නිදහස් කිරීම සුදුසු බවත් එය කොමසාරිස්තුමා මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.16. පුහුණු වැඩ පරිපාලක තනතුරේ සේවය කිරිම සම්බන්ධවයි.

ලුණුගල,අරවාකුඹුර,ඇතුන්දමුවාව,නිපුන් සෙවන ලිපිනයේ පදිංචි කේ.ඩී.අංජන නිපුන් මධුශංක මහතා බදුල්ල තාක්ෂණ විද්‍යාලයෙන් ඉදිකිරීම් අංශයෙන් පුහුණුව ලබා මාස 06 ප්‍රායෝගික පුහුණුව සඳහා 2022/10/29 දින බිබිල ප්‍රාදේශීය සභාව වෙත පැමිණි අතර එදින සිට මේ දක්වා බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි මහතා යටතේ දැනට ඉදිකරමින් පවතින කර්මාන්තවල අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. වැඩ පරිපාලක වශයෙන් අධීක්ෂණ කටයුතු දිනපතා සිදු කළ නමුත් ඒ සඳහා කිසිදු ගෙවීමක් මේ දක්වා ප්‍රාදේශීය සභාව මඟින් සිදු කර නොමැත.තමා ලුණුගල ප්‍රදේශයේ ඇතුන්දමුවාවේ සිට දිනපතා බසයෙන් පැමිණෙන අතර රට තුළ දැනට පවතින ආර්ථික අපහසුතා මැද තමන්ද ඉතා අපහසු වෙන් කටයුතු කරන බැවින් ප්‍රාදේශීය සභාව මඟින් මසකට යම් දීමනාවක් හෝ ලබා දෙන ලෙසත් ඉදිරියටත් තම සේවය මෙම ආයතනයට ලබා දිය හැකි බවත් ලිපියක් මඟින් දන්වා ඇත.මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මාස 06 පුහුණු කාලසීමාව තුල වෙනත් ආයතනවල මුදලක් ගෙවන බැවින් මොහුට පමණක් මාසයකට රු.6000.00 බැගින් ලබා දීම සුදුසු බවත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන එම දීමනාව ගෙවීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මාස 06 පුහුණු කාලසීමාව තුල වෙනත් ආයතනවල මුදලක් ගෙවන බැවින් මොහුට පමණක් මාසයකට රු.6000.00 බැගින් ලබා දීම සුදුසු බවත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන එම දීමනාව ගෙවීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසීය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**මාසික සභා රැස්වීම තේ පැන් සංග්‍රහය සඳහා පෙ.ව 11.30ට අවසන් කර අතර නැවත පෙ.ව.11.45ට ආරම්භ කරන ලදී.**

## 05.01.17. ZA-5419 අංක දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අලුත් වැඩියා කිරිම සම්බන්ධවයි.

ඉහත අංක දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදා ගනිමින් 2023.01.04 දින මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන අතරතුර යන්ත්‍රයේ වෝල්ටර්නේටරය හා ෆෑන් බෙල්ට් එක කැඩී යාමෙන් යන්ත්‍රය එම ස්ථානයෙන් ඉවත් කර ගැනීමට පවා අපහසු වී ඇත. ඒ අනුව මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයට ඉහත සඳහන් අක්‍රීය වූ අමතර කොටස් යොදා අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අදාල නියෝජිත ආයතනය සමඟ දුරකථනයෙන් සිදු කල සංවාදයේදී රු.500,000.00ක පමණ මුදලක් වැයවන බව පවසා ඇත.එබැවින් අදාල අලුත්වැඩියාව කඩිනමින් සිදු කිරීමටත් ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී නියෝජිත ආයතනය මඟින් මිල සාධාරණීයකරණ වාර්තාවක් ගැනීමත් පිට ස්ථානවලින් මිල ගණන් කැඳවා සැලකිය යුතු මට්ටමින් මෙම මුදල අඩු වේ නම් ඒ පිළිබඳව ද සලකා බලා කටයුතු කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

නියෝජිත ආයතනය මඟින් මිල සාධාරණීයකරණ වාර්තාවක් ගැනීමත් පිට ස්ථානවලින් මිල ගණන් කැඳවා සැලකිය යුතු මට්ටමින් මෙම මුදල අඩු වේ නම් ඒ පිළිබඳව ද සලකා බලා කටයුතු කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18. බිබිල පුස්තකාලයේ පරිගණක අංශයේ කාපට් ඇතිරීම / ටයිල් ඇල්ලීම සම්බන්ධවයි.

බිබිල මහජන පුස්තකාලය සඳහා 2021 වර්ෂයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) විසින් පුස්තකාල ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා අවශ්‍ය රුපියල් මිලියන 5ක් වටිනා සියළු උපාංග හා උපකරණද ඒ සඳහා අවශ්‍ය සේවාවන් සැපයීම පිළිබඳව දැනුම් සම්භාරයක්ද මේ වන විට ලබා දී ඇති බව සතුටින් දන්වා සිටින අතර, 2022 දෙසැම්බර් මස 31 දිනට පෙර මෙම පුස්තකාල ස්වයංක්‍රීයකරණ ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය අවසන් කිරීමත් සමග ජනතා අයිතියට පැවරීම හා පාඨක අවශ්‍යතා සපුරා ගැනීමට ඔවුන් වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය විවෘත කිරීමේ

උත්සවයක් සංවිධානය කිරීමට සිදු වී ඇති බැවින් 2023 ජනවාරි මස 27 වන දිනට පෙර පරිගණක අංශයේ බිම කාපට් කිරීම/ටයිල් ඇතිරීම සුදුසු බවටත් ඒ සඳහා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කාපට් ඇතිරීමේදී එහි පැවැත්ම දීර්ඝකාලීන නොවන නිසාත් දැනට වෙලඳපොලේ ටයිල්වල මිල තරමක් අඩු වී ඇති නිසාත් පරිගණක අංශය පමණක් ටයිල් කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කාපට් ඇතිරීමේදී එහි පැවැත්ම දීර්ඝකාලීන නොවන නිසාත් දැනට වෙලඳපොලේ ටයිල්වල මිල තරමක් අඩු වී ඇති නිසාත් පරිගණක අංශය පමණක් ටයිල් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.19. පොදු වෙළඳපොල A-16 කඩ කාමරය සම්බන්ධවයි.

බිබිල පොදු වෙළඳපොල A -16 කඩ කාමරය සුන්දර බේක්හවුස්,පොදුවෙළඳපොල,බිබිල ලිපිනයේ පදිංචි එච්.එම්.කරුණාසුන්දර යන අය විසින් බදු ගෙන ඇත. මෙම කඩ කාමරය අබලන් තත්වයට පත්ව ඇති බව ඒ මහතා විසින් දන්වා ඇත. මෙම කඩ කාමරය මාස 04 ක පමණ කාලයක් වසා තිබූ බැවින් මෙම වසා තිබූ කාල සීමාවට සහනයක් ලබා දෙන ලෙසත් මෙම කඩ කාමරය පිළිසකර කර දෙන ලෙසත් ඒ මහතා විසින් ඉල්ලීම් කර ඇත.

එහෙත් මෙම බදුකරු විසින් මෙම කඩ කාමරයට අදාලව සහන ලබා දෙන ලෙස ඉල්ලා තිබූ මාස වලට අදාළ කුලී මුදල් 2022/12/23 ලදුපත් අංක 1137 යටතේ ගෙවා අවසන් කරන ලද අතර 2022.12.31 දිනට තව දුරටත් හිඟ කුලී මුදල ලෙස ගෙවීමට ඇත්තේ රු.5000.00 ක මුදලක් පමණි. මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම කඩකාමරය අළුත් වැඩියාව සිදු කිරීම සුදුසු බවටත් ඒ සඳහා කාර්මික නිලධාරි මඟින් ඇස්තමේන්තුවක් සකස්කර ඒ අනුව අළුත්වැඩියාව සිදු කිරිම සුදුසු බවටත් හිඟ මුදල වන රු.5000.00 මුදල නිදහස් කිරිම සුදුසු බවත් එසේ නිදහස් කිරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම කඩකාමරය අළුත් වැඩියාව සිදු කිරීම සුදුසු බවටත් ඒ සඳහා කාර්මික නිලධාරි මඟින් ඇස්තමේන්තුවක් සකස්කර සිදු කිරිම සුදුසු බවටත් හිඟ මුදල වන රු.5000.00 මුදල නිදහස් කිරිම සුදුසු බවත් එසේ නිදහස් කිරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.20. පොදු වෙළඳපොලේ මැද මිදුල සකස් කිරීම සම්බන්ධවයි.

පොදු වෙළඳපොලේ මැද මිදුල දැඩි ලෙස අබලන් වීම හේතුවෙන් ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්වයේ පවති.මේ පිළිබඳව ජනතාවගේ ඉල්ලීම් රාශියක් ලැබී ඇති බැවින් අලුත් වැඩියා කටයුතු කඩිනමින් සිදු කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒබීසී හා චිප්ස් යොදා කඩිනමින් සකස් කිරිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඒබීසී හා චිප්ස් යොදා කඩිනමින් සකස් කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 05.01.21. බිබිල පුස්තකාලයේ පරිගණක අංශයේ ජනෙල් තිර රෙදි සකස් කිරීම සම්බන්ධවයි.

බිබිල මහජන පුස්තකාලයේ පුස්තකාලයේ පරිගණක අංශයේ ජනෙල් 03ක් (වර්ටිකල් බලයින්ඩ්) වර්ගයේ තිර රෙදි දමා සකස් කිරිමට අවශ්‍ය වී ඇති බවත් ඒ සඳහා ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවීමෙන් අනතුරුව අංක 18 බි, සුපර් මාර්කට්,බිබිල ලිපිනයෙහි අනුර ටේලර්ස් ආයතනය විසින් රු.106,312.50ක අවම මිල ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම ආයතනයෙන් එම සේවාව ලබා ගැනිම හා ඒ සඳහා වැය වන මුදල සභා අරමුදලින් දැරිමත් සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.22 බිබිල මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස මහජන අයිතියට පැවරීමේ උත්සවය සඳහා ඇස්තමේන්තුවට අදාල කාර්යයන්

ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතියට අයත් බිබිල ප්‍රාදේශීය සභාවේ බිබිල මහජන පුස්තකාලය ඩිජිටල් පුස්තකාලයක් ලෙස මහජන අයිතියට පැවරීමේ උත්සවය සඳහා ඇස්තමේන්තුවට අදාල සිදු කිරිමට නියමිත කාර්යයන් කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

**සිදු කිරීමට නියමිත කාර්යන්**

| | |
|---|---|
| 01.ශාලා පහසුකම් ලබා ගැනීම. | ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය (බිබිල ප්‍රාදේශීය සභාව මගින්) |
| 02.ශබ්ද විකාශන යන්ත්‍ර ලබා ගැනීම. | බිබිල ප්‍රාදේශීය සභාව මගින් |
| 03.ආරාධනා පත්‍ර සැකසීම | පුස්තකාල කාර්ය මණ්ඩලය මගින් සකස් කරනු ලැබේ. |
| 04.බැනරය (ශාලාව ඇතුලේ ගැසීම සඳහා )ඩිසයින් කල යුතුව ඇත. | ප්‍රාදේශීය සභාව මගින් |
| 05.ආරාධනා කිරීමට නියමිත නිලධාරීන් | 1. ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය |
| | 2. සභා ලේකම්තුමිය |
| | 3. ගරු විජිත බේරුගොඩ මැතිතුමා - පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය, පාර්ලිමේන්තු මන්ත්‍රී |
| | 4. ප්‍රාදේශීය සභා සියළු කාර්ය මණ්ඩලය |
| | 5. ඒ ජේ එම් මුසම්මිල් මැතිතුමා - ඌව පළාත් ආණ්ඩුකාරවර |
| | 6. ඩබ්ලිව්. සුනිල් මහතා - අධ්‍යක්ෂ ජනරාල් - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| | 7. අරවින්ද මහතා -අධ්‍යයන හා පුහුණු අධ්‍යාක්ෂක - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - කොළඹ |
| | 8. මහාචාර්ය නන්ද ධර්මරත්න මහතා - සභාපති - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| | 9. කාංචන කුඩුගල මහතා - ප්‍රධාන ඩිජිටල් රාජ්‍ය නිළධාරී ශ්‍රීලංකාතොරතුරුහාසන්නිවේදනතාක්ෂණනියෝජිතායතනය |
| | 10. එම් එම් විජේනායක - ඌව පළාත් පාලන කොමසාරිස්තුමා - බදුල්ල |
| | 11. පී. කුමාර - සහකාර කොමසාරිස්තුමා - මොණරාගල |
| | 12. කේ එම් අසිත සඳරුවන් මහතා - ඌව පළාත් අධ්‍යක්ෂක - බදුල්ල |
| | 13. ගෝතමීකෞශල්‍යා - ප්‍රජා සංවර්ධන නිළධාරී - මොණරාගල |
| | 14. විදුහල්පති - මහාමාත්‍ය විද්‍යා විද්‍යාලය<br>විදුහල්පති - යශෝධරා බාලිකා විද්‍යාලය |
| | 15. අමිල මහතා - උපදේශක කමිටු සාමාජික |
| | 16. සරත් මහතා - උපදේශක කමිටු සාමාජික |
| | 17. වික්ටර් මහතා - උපදේශක කමිටු සාමාජික |
| | 18. සිරිවර්ධන මහතා - උපදේශක කමිටු සාමාජික |

| | |
|---|---|
| | 19. චන්ද්‍රපාල මහතා - උපදේශක කමිටු සාමාජික |
| | 20. කොටගම මහජන පුස්තකාල උපදේශක කමිටු සාමාජික දෙදෙනෙක් |
| | 21. නාගල මහජන පුස්තකාල උපදේශක කමිටු සාමාජික දෙදෙනෙක් |
| | 22. පාඨක සමාජයේ නිළධාරී මණ්ඩලය හා සාමාජික පිරිස 50 ක් පමණ |
| | 23. පුස්තකාල තුනෙහිම කාර්ය මණ්ඩලය |
| 06.ප්‍රචාරක කටයුතු | පාඨක සමාජය මගින් සිදු කරනු ලැබේ. |
| 07.නේවාසික පහසුකම් ලබා දීමට නියමිත ආරාධිත අමුත්තන් ගණන | 08 |
| 08.ආරාධිත විශේෂ අමුත්තන් සඳහා නේවාසික පහසුකම් ලබා දීම. | නේවාසික පහසුකම් සඳහා තේරීමට නියමිත නේවාසිකාගාර<br>• කිංකිනි හොටෙල්<br>• කැම්බෝ හොටෙල්<br>• අමෝදා හොටෙල්<br>• ඕරින්මා හොටෙල් |
| 09.ආහාර ලබා දීම | පැමිණි පළමු දිනයේ රාත්‍රී ආහාරය<br>• බත්<br>• ඉඳි ආප්ප<br>• කුකුල් මස් ව්‍යංජනය<br>• පොල් සම්බෝල<br>• පරිප්පු<br>• බෝංචි<br>• අතුරුපස - වටලප්පන් හෝ යෝගට් |
| | පසු දින උදෑසන තේ පානය<br>• කිරි තේ |
| | පසු දින උදේ ආහාරය<br>• පාන්<br>• බත්<br>• මාළු හොදි<br>• පරිප්පු<br>• පොල් සම්බෝල |
| | පසු දින දිවා ආහාරය සඳහා<br>• බත්<br>• කුකුල් මස් ව්‍යංජනය<br>• පරිප්පු<br>• පපඩම්<br>• මඤ්ඤොක්කා කොළ මැල්ලුම්<br>• කොස්<br>• පොලොස්<br>• තිබ්බටු මැල්ලුම<br>• කෙසෙල්මුව<br>• කොරලි මාළු<br>• අතුරුපස - මිශ්‍ර පලතුරු සලාදයක් හෝ ජෙලි |
| 10.උත්සවය සඳහා පැමිණෙන නිලධාරීන් සඳහා තේ සංග්‍රහය | 01. හැලප - බිබිල පුස්තකාල කාර්ය මණ්ඩලය |
| | 02. බිස්කට් - නාගල පුස්තකාලය |
| | 03. කෙසෙල් ගෙඩි - කොටගම පුස්තකාලය |
| | 04. කේක් - ප්‍රාදේශීය සභාව මගින් |
| | 05. පැටිස් - ප්‍රාදේශීය සභාව මගින් |

| | |
|---|---|
| | 06. හකුරු - ප්‍රාදේශීය සභාව මගින් |
| | 07. බෙලිමල් - පුස්තකාලයාධිපතිතුමිය |
| 11.උත්සවය සඳහා පැමිණෙන පාඨක පිරිස වෙනුවෙන් සංග්‍රහය | 01. පලතුරු බීම - ප්‍රාදේශීය සභාව මගින් |
| | 02. කේක් - ප්‍රාදේශීය සභාව මගින් |
| | 03. කෙසෙල් - ප්‍රාදේශීය සභාව මගින් |
| 12.සංස්කෘතික අංග දෙකක් | 01.යශෝධරා බාලිකා විද්‍යාලය |
| | 02.මහාමාත්‍ය විද්‍යා විද්‍යාලය |
| 13.සැරසිලි | • බැලුන් - ප්‍රාදේශීය සභාව මගින්<br>• ක්‍රේප් පටි - ප්‍රාදේශීය සභාව මගින් |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී මිල ගනන් කැඳවා එම කාර්යයන් සිදු කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මිල ගනන් කැඳවා එම කාර්යයන් සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.23.බහු කාර්ය ගොඩනැගිල්ල අංක 06 කඩකාමරය සම්බන්ධවයි.**

බිබිල,රතුපස්කැටිය,නිපුනි ලිපිනයේ පදිංචි එච්.ආර්.දිනේෂ් රූපසිංහ මහතා විසින් පසුගිය කොරෝනා වසංගතය හේතුවෙන් බහු කාර්ය ගොඩනැගිල්ලේ අංක 06 දරණ කඩ කාමරය වසා තැබීම හේතුවෙන් එම කාල සීමාව තුල දඩ මුදල් ඉවත් කොට හිඟ මුදල ගෙවීමට සහනදායි ක්‍රමයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී දඩ මුදලින් භාගයක් හා හිඟ කුලී මුදල වාරික එකකින් හෝ දෙකකින් ගෙවීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

දඩ මුදලින් භාගයක් හා හිඟ කුලී මුදල වාරික එකකින් හෝ දෙකකින් ගෙවීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.24. 2023 වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල සඳහා වූ ආකෘතිපත්‍ර භාවිතා කිරීම සම්බන්ධවයි.

2023 වර්ෂය සඳහා මොනරාගල දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල සඳහා වූ ආකෘතිපත්‍ර භාවිතා කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි. ඒ ආකෘති පහත දැක්වේ.

ා

පාසල් ළමුන් සඳහා පමණි

| |
|---|
| සාමාජික අංකය:- ......................... |
| නිකුත් කල දිනය:- ......................... |
| ලදු පත් අංක:- ......................... |

[කාර්යාල ප්‍රයෝජනය සඳහා]

**........................ ප්‍රාදේශීය සභාව**

**........................ මහජන පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය**

ළමා අංශය

01). පෞද්ගලික තොරතුරු

**a].** ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :- ....................................................

**b]** .ස්ථිර ලිපිනය:-....................................................

**c].** තැපැල් ලිපිනය :-....................................................

**d].** ඊමේල් ලිපිනය:-....................................................

**e].** දුරකතන අංකය:-.......... (ජංගම)........... (නිවස).......... **WhatsApp** ..........

**f].** උපන් දිනය :-....................................................

**g].** පාසල :- ....................................................

**i].** පාසලේ ලිපිනය :- ....................................................

**j].** පාසලේ දුරකතන අංකය :- ....................................................

**h].** පාසලේ/රාජකාරි ස්ථානයේ ලිපිනය:-....................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා මෙම පුස්තකාලයේ සාමාජිකයෙකු /සාමාජිකාවක් ලෙස බඳවා ගන්නා ලෙස ඉල්ලා සිටින අතර පුස්තකාලයේ අතුරු ව්‍යවස්ථාවට යටත්ව කටයුතු කරමි. මා විසින් ලබා ගන්නා පොත් නැතිවීම, විකෘති වීම හෝ වෙනත් හානියක් සිදුවුවහොත්, එම පොත නැවත සපයා ගැනීමේ වියදම් හා 25% ක් වූ දෙපාර්තමේන්තු ගාස්තුව ගෙවීමට ද එකඟ වෙමි. තවද මා විසින් පරිශීලනය කරනු ලබන පොත් මැනවින් ආරක්ෂා කිරීමට බැදී සිටින අතර වයස අවුරුදු 12 සම්පූර්ණ වීමෙන් පසුව වැඩිහිටි සමාජිකත්වය ලබා ගැනීමටත් වසර 03 කට වරක් සාමාජිකත්වය අලුත් කිරීම සඳහා බැදී සිටින බවටත් සහතික වෙමි.

....................

දිනය:- ................ ඉල්ලුම්කරුගේ අත්සන

02.හරකරුගේ සහතිකය

........................................................................................................................ ලිපිනයේ පදිංචි ........................................................................................................ වන මාගේ දරුවා / ඥාතියා යන අයට ඔබ පුස්තකාලයේ පොත් ලබා දෙන ලෙස ඉල්ලුම් කරන අතර ඔහු / ඇය විසින් පුස්තකාලයට යම් අලාභයක් කරනු ලබන්නේ නම් එම අලාභය හා ප්‍රමාද ගාස්තු ආදිය නොපමාව ගෙවීමට ද පොරොන්දු වෙමි. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

නම :-.............................................................
ලිපිනය :-.........................................................

දිනය :- .........................

මව / පියා / භාරකරුගේ අත්සන :- ........................

---

03).විදුහල්පතිගේ සහතිකය.

..............................................................................................ශිෂ්‍යයා/ශිෂ්‍යාව. ............................................................ක.වි/ ප්‍රා.වි/ ම.වි/ ම.ම.වි. ..................... ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර පොත් පරිශීලනයේදී අදාල නිති රීති වලට අනුකූලව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙමි.

............................

දිනය:- ..................

විදුහල්පතිගේ අත්සන (නිල මුද්‍රාව)

---

04).පුස්තකාලයාධිපතිගේ නිර්දේශය

මෙම අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර ඇත/නැත. සාමාජිකත්වය ලබා ගැනීම සඳහා නිර්දේශ කරමි. / නොකරමි. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය භාර ගතිමි. සමාජික ගාස්තු වශයෙන් රු. 100 ක මුදල අය කර ගතිමි. සියළුම ජාතික හැඳුනුම්පත් වල ඡායා පිටපත් අමුණා ඇත / නැත.

දිනය:- ........................ ............................

පුස්තකාලයාධිපතිගේ අත්සන

---

05. සභාපති /සභා ලේකම්ගේ අනුමැතිය

ඉහත සඳහන් අයදුම්කරුට / අයදුම්කාරියට සමාජිකත්වය ලබාදීම අනුමත කරමි . නොකරමි.

දිනය :- .......................... ............................

සභාපති /සභා ලේකම් (නිල මුද්‍රාව)

වැඩිහිටි සාමාජිකත්වය සඳහා පමණි

| |
|---|
| සාමාජික අංකය:- ........................... |
| නිකුත් කල දිනය:- ........................... |
| ලදු පත් අංක:- ........................... |

[කාර්යාල ප්‍රයෝජනය සඳහා]

........................ ප්‍රාදේශීය සභාව
........................ මහජන පුස්තකාල සමාජිකත්වය ලබා ගැනීම සඳහා වූ
අයදුම් පත්‍රය

වැඩිහිටි අංශය

01). පෞද්ගලික තොරතුරු

**a].** ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :- ................................................

**b]** .ස්ථිර ලිපිනය :-. ... ................................................

**c].** තැපැල් ලිපිනය :- ................................................

**d].** ඊමේල් ලිපිනය :-. ................................................

**e].** දූරකතන අංකය :-. ........... (ජංගම). ........... (නිවස). .......... **WhatsApp** ..........

**f].** ජාතික හැඳුනුම්පත් අංකය :-. ................................................

( ඡායා පිටපත් ඉදිරිපත් කල යුතුයි )

**g].** උපන් දිනය :- ................................................

h**].** රාජකාරි ස්ථානය :- ................................................

**j].** රාජකාරි ස්ථානයේ ලිපිනය :- ................................................

**i].** රාජකාරි ස්ථානයේ දූරකතන අංකය :- ................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,මා මෙම පුස්තකාලයේ සාමාජිකයෙකු /සාමාජිකාවක් ලෙස බඳවා ගන්නා ලෙස ඉල්ලා සිටින අතර පුස්තකාලයේ අතුරු ව්‍යවස්ථාවට යටත්ව කටයුතු කරමි. මා විසින් ලබා ගන්නා පොත් නැතිවීම, විකෘති වීම හෝ වෙනත් හානියක් සිදුවුවහොත්, එම පොත නැවත සපයා ගැනීමේ වියදම් හා 25% ක් වූ දෙපාර්තමේන්තු ගාස්තුව ගෙවීමට ද එකඟ වෙමි.තවද මා විසින් පරිශීලනය කරනු ලබන පොත් මැනවින් ආරක්ෂා කිරීමට බැඳී සිටින අතර වසර 03 කට වරක් සාමාජිකත්වය අලුත් කිරීම සඳහා බැඳී සිටින බවටත් සහතික වෙමි.

දිනය:-. ..................           ඉල්ලුම්කරුග්අත්සන:-. ...............

සැ.යු

- වරිපනම් බදු සීමාවේ පිහිටි මහජන පුස්තකාල සමාජිකත්වය ලබා ගැනීමේදී සභාව වෙතබදු ගෙවන්නකු විසින් මෙම කොටස සම්පූර්ණ කල යුතුය.
- වරිපනම් බදු සීමාවෙන් පිටත පිහිටි මහජන පුස්තකාල සමාජිකත්වය ලබා ගැනීමේදී බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවකු විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුයි.

02.ඇපකරුගේ ප්‍රකාශනය

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .මහතා / මිය / මෙනවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු / ඇය විසින් පුස්තකාලයට යම් අලාභයක් කරනු ලබන්නේ නම් එම අලාභය හා ප්‍රමාද ගාස්තු ආදිය අයකර දීමට හෝ මා විසින් ගෙවීමට මෙයින් පොරොන්දු වෙමි.

නම :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

පෞද්ගලිකලිපිනය :- . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . .

රැකියාව :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

රාජකාරි ලිපිනය :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දුරකතන අංකය :-. . . . . . .. . . . . .. . . . . . . . . . . . . . . . . . . . . .

ජාතික හැඳුනුම්පත් අංකය :- . . . . . . . . . . . . . . . . . . ..( ඡාය පිටපත් ඉදිරිපත් කළ යුතුයි. )

වරිපනම් බදු බලපත්‍ර අංකය :- . .. . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය :- . . . . . . . . . . . . . . . . . . . . .                . . . . . . . . . . . . . . . . . . . . . . .

ඇපකරුගේ අත්සන

---

03.ග්‍රාම නිලධාරිගේ සහතිකය

ඉහත සඳහන් අයදුම්කරු / අයදුම්කාරියට අංක. . . . . . . . . . . . . . .. . . . . . . .. . ග්‍රාම නිලධාරි වසමේ

. . . . . . . . . . . .ගමේ ගෘහ මූලික අංක . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . දරණ නිවසේ ස්ථිර

පදිංචිකරුවකු බව මෙයින් සහතික කරමි.

දිනය :- . . . . . . . . . . . . . . . . . .                . . . . . . . . . . . . . . . . . . .

අත්සන (නිල මුද්‍රාව)

---

04).පුස්තකාලයාධිපතිගේ නිර්දේශය

මෙම අයදුම් පත නිවැරදිව සම්පූර්ණ කර ඇත/නැත. සමාජිනකත්වය ලබා ගැනීම සඳහා නිර්දේශ කරමි . / නොකරමි. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය භාර ගතිමි. සාමාජික ගාස්තු වශයෙන් රු.100 ක මුදල අය කර ගතිමි. සියළුම ජාතික හැඳුනුම්පත් වල ඡායා පිටපත් අමුණා ඇත / නැත.

දිනය:-........................                . . . . . . . . . . . . . . . . . . . .

පුස්තකාලයාධිපතිගේ අත්සන

05).සභාපති /සභා ලේකම්ගේ අනුමැතිය

ඉහත සඳහන් අයදුම්කරුට /අයදුම්කාරියට සාමාජිකත්වය ලබාදීමඅනුමත කරමි/ නොකරමි.

. . .. . . . . . . . . . . . . . . . . .. . . . .

දිනය :-. . . . . . . . . . . .. . . .                                    සභාපති/ සභා ලේකම් (නිල මුද්‍රාව)

02

බලප්‍රදේශය තුළ පුස්තකාල අතර යොමු ගත සේවාව

පුස්තකාලයේ නම

**ප්‍රාදේශීය සභාව**

| |
|---|
| ........................... ප්‍රදේශය සභාව සතු ..............................මහජන පුස්තකාල වල සමාජිකත්වයට මෙම අයදුම් පත සම්පූර්ණ කිරීමෙන් පසු බල ප්‍රදේශය තමන් කැමති මහජන පුස්තකාලයකින් පොත් ලබා ගත හැකිය. මෙය දින 14 ක් සඳහා නිකුත් කරන අතර එකී කාලය තුළ නැවත පොත භාරදිය යුතුය මෙය විශ්වාසය මත පදනම වන සේවාවකි.මෙම ඉල්ලුම් පත්‍රය මාස 06 කට වරක් අලුත් කල යුතුය. |

01.සාමාජිකත්වය ලබා ඇති පුස්තකාලයේ නම :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . .

02.සාමාජිකයාගේ නම :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . .

03. සාමාජිකයාගේ ලිපිනය:- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . . . . . . .. . .

04. සාමාජිකයාගේ අංකය:- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . . .. . . . .. . . . . . .. . .

05.දුරකතන අංකය :- . . .. . . . . . . . . . .                WhatsApp අංකය:- . . . . . . . . . . . . . . . . . .

06.පොත් ලබා ගැනීමට බලාපොරොත්තු වන මහජන පුස්තකාලයේ නම:- . . . . . . . . . .. . . . . . . . . ..

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් මා හට එම පුස්තකකාලයෙන් පොත් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් මා විසින් ලබා ගන්නා පොත් නියමිත දිනට පොත තිබූ තත්වයෙන් නැවත භාර දෙන බවත් එම නියමිත දිනට පොත් භාර දීමට නොහැකි වූයේ නම් එම පුස්තකාලයට අදාල ප්‍රමාද ගාස්තු ගෙවීමටත් එම පුස්තකාලයේ නීති රීති වලට එකඟව කරන බවත් මෙයින් සහතික වෙමි.

. . . . . . . . . . . . . . . . . .                                    . . . . . . . . . . . . . . . . . . . .

දිනය                                    පාඨක අත්සන

## 07. පුස්තකාලයාධිපති /පුස්තකාල භාරකරු / පුස්තකාල සහයක,

. . . . . . . . . . . . . . . . මහජන පුස්තකාලය.

මෙම අයදුම්පත්‍රය රැගෙන එන ඉහත සඳහන් . . . . . . . . . . . . . . . . . . .සාමාජික අංක දරණ සාමාජිකයා අප පුස්තකාලයේ විශ්වාසනීය සාමාජිකයකු වන බැවින් ඔහුට /ඇයට . . . . . . . . . . . . . . . . . .. .මහජන පුස්තකාලයේ පොත් බැහැර දීම සුදුසු බව සහතික කරන අතර, රැගෙන යන පුස්තකාල ද්‍රව්‍ය සඳහා සාමාජිකයා සේම මා විසින්ද සම්පූර්ණ වගකීම් දරන බවට සහතික වෙමි. වාර්ෂික තොග සමීක්ෂණයේදී ඔහු /ඇය විසින් රැගෙන ගිය පොත්භාරදී නොතිබුන හොත් ඌණ පොත් සේ සලකා ඊට අදාල ගෙවීම් මා විසින් පෞද්ගලිකව දරන බවට එකඟ වෙමි.

. . . . . . . . . . . . . . . . . .                                    . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය                                    පුස්තකාලයාධිපති / පුස්තකාල භාරකරු

. . . . . . . . . . . . . . . මහජන පුස්තකාලය.

01

**කාර්යාල ප්‍රයෝජනය සඳහා**

ඔබ විසින් යොමු කරන ලද සමාජිකයා සඳහා . . . . . . . . . . . . . . . . . . . . . . . . . .පුස්තකාලයෙන් පොත් බැහැර දීම අනුමත කරමි/නොකරමි.

. . . . . . . . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය පුස්තකාලයාධිපති / පුස්තකාල භාරකරු

අවසාන සිහිකැදවීම

202.... ...........

.................. මයා /මිය /මෙනවිය.

............ ..........

........ .............

**පුස්තකාල පොත් ආපසු භාර නොදීම පිළිබඳවයි.**

................ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන, ................. මහජන පුසතකාලයේ සාමාජික අංක ......දරණ ඔබ 20 ............ දින පුස්තකාලයෙන් බැහැරගෙන යනලද පරිග්‍රහණ අංක......../.........හා.01.................................................

02.......................................................... නම් වූ පොත් මෙතෙක් ආපසු පුස්තකාලයට භාරදීනොමැත.

02. මේ පිළිබඳව ඔබ වෙත අවස්ථා ගණනාවකදී සිහි කැදවීම් කලත් කිසිදු සැලකිල්ලක් නොදක්වන බව මා වෙත වාර්ථා වී ඇත.

03.පුස්තකාල සේවාව ප්‍රාදේශීය සභාව මගින් ප්‍රදේශයේ ජනතාවට කරනු ලබන මහඟු සේවයක් බව ඔබ දන්නා කරුණකි. එහෙත් ඔබ විසින් මෙසේ කටයුතු කිරිම තුළින් අනෙකුත් පාඨකයන්ට සිදුවන්නේ බලවත් අසාධාරණයකි.

04.එබැවින් මෙම ලිපිය ලද වහාම ඔබ රැගෙන ගොස් ඇති පොත් හෝ එහි වටිනා කම ......................... ........... මහජන පුස්තකාලයට ලබා දෙන ලෙසත්, මේ පිළිබද ඔබ තවදුරටත් සැළකිල්ලක් නොදක්වන්නේ නම් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඔබට විරුද්ධව පොදු දේපල පනත යටතේ අධිකරණය මගින් නිත්‍යානුකූල පියවර ගැනීමට සිදුවන බව කණගාටුවෙන් වුවද දැනුම් දෙමි.

සභා ලේකම්

ප්‍රාදේශීය සභාව

....................

මේ පිළිබඳව ඔබ වෙත ............ දිනැතිව පළමු සිහිකැදවීමද ........... දිනැතිව දෙවන සිහි කැදවීමද යොදු කර ඇතත් ඔබ විසින් මෙතෙක් පොත් භාර දීම පැහැර හැර ඇත.

II වන සිහි කැඳවීම

පුස්තකාලයාධිපති,

මහජන පුස්තකාලය

................ .

202............

................මයා /මිය/මෙනවිය

......................

....................

<u>පුස්තකාල පොත් ආපසු භාර නොදීම පිළිබඳවයි.</u>

................ ප්‍රාදේශීය සභාව මගින් පාලනයවන, ................ මහජන පුසතකාලයේ සමාජික අංක .............. දරණ ඔබ 20 ............ ..දින පුස්තකාලයෙන් බැහැරගෙන යන ලද පරිග්‍රහණ අංක ........./ .......... හා 01.......................................... 02...............................................නම් වූ පොත් මෙතෙක් ආපසු පුස්තකාලයට භාරදී නොමැත.

02 .............. දිනැතිව ඔබ වෙත පළමු සිහිකැඳවීම සිදු කර ඇති නමුත් මේ වන තෙක් එම පොත් පුස්තකාලය වෙත භාරදීමට ඔබ විසින් කටයුතු කර නොමැත. එබැවින් මෙම ලිපිය ලද වහාම ඔබ විසින් රැගෙන යන ලද පොත් පුස්තකාලයට භාරදෙන ලෙසටත්, එසේ නොකරන්නේ නම් නීත්‍යානුකූලව කටයුතු කිරීමට සිදුවන බවටත් දන්වමි.

පිටපත ( ඇපකරුගේ දැන ගැනිම සඳහා / පොත් භාර දිම සඳහා සමාජිකයා යොමු කිරීම සඳහා )

.....................

.....................

.................. ..

........................

පුස්තකාලයාධිපති

...................... මහජන පුස්තකාලය

අනුපිටපත් ලබාදීම

.........................

.........................

දිනය ...................

පුස්තකාලයාධිපති,

............. .. මහජන පුස්තකාලය,

.................... ....

පුස්තකාලයාධිපති තුමියනි,

**<u>පුස්තකාල සාමාජික කාඩ්පත අස්ථානගත වීම</u>**

.................... ....... .වන මාගේ සාමාජික අංක ................දරණ සමාජික කාඩ්පත් අස්ථානගතවී ඇත. මා හට නැවත මෙම පුස්තකාලයෙන් පොත් බැහැර ගෙන යාම සඳහා නව සමාජික කාඩ්පතක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින අතර, මාගේ දුරකථන අංකය හා වට්ස්ඇප් ( WhatApp) අංක පහත සඳහන් කරමි.

දුරකථන අංකය :- ................ ..    වට්ස්ඇප් ( WhatApp ) :- . ..................

.................

පාඨක අත්සන

අදාළ ලේඛන සියල්ල පරීක්ෂා කර සොයා බලා කඩිනමින් / දින 07ක් / දින 14 ඇතුළත නව කාඩ්පතක් / අනුපිටපතක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න.

දිනය. . . . . . . . . . . . .    .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. .

පුස්තකාලයාධිපති

පාඨක පැමිණීමේ ලේඛනය , දඩ මුදල් සහ සිහි කැඳවීම් ලේඛන අධීක්ෂණය කිරීමෙන් පසු මෙම සාමාජිකයා වෙත නව කාඩ්පතක් / අනුපිටපතක් නිකුත් කරන ලදි.

කාඩ්පත නිකුත් කරන නිලධාරියාගේ නම :-... . . . . . . . . . . . . . . . . . . . . . . . . . . ..

අත්සන :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

දිනය :- . . . . . . . . . . . . . . . . . . . . . . .. . . .

එබැවින් ඔබ විසින් මහජන පුස්තකාලයෙන් රැගෙන ගිය ග්‍රන්ථය / ග්‍රන්ථ වහාම . . . . . . . . . . . . මහජන පුස්තකාලය වෙත ආපසු ගෙනවිත් භාර දීම හෝ එය අස්ථානගත වී ඇත් නම් ඊට අදාළ ගාස්තු ගෙවීමට කටයුතු කරන ලෙසත් මෙයින් දන්වා සිටින අතර එසේ නොකරන්නේ නම් ඔබට ඇප වී ඇති පහත නම සඳහන් ඇපකරුගෙන් අදාල මුදල් අය කිරීමට සිදු වන බව දන්වමි.

එසේම ඔබ වෙත 2013.06.28 දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයේ1816/43 එසේම 1816/43 – 2013 ජුනි 28 දිනැතිව නිකුත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 6 වන කොටසෙහි සඳහන් පුස්තකාල හා කියවීම් ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ඔබ වෙත නීති මගින් කටයුතු සිදු කරන බවද දන්වමි. එමෙන්ම ඔබේ සමාජිකත්වයද අහිමි වනු ඇත .

ලේකම්

. . . . . . . . . . . . . . .ප්‍රාදේශීය සභාව

---

පිටපත ( ඇපකරු )

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . ඉහත ලිපිනයේ නම සඳහන් අය .. . . . . . . . . . . . . මහජන පුස්තකාලයෙන් පොත් බැහැර ගෙන ගොස් ආපසු භාර දී නැත . අවස්ථා දෙකකදී සිහි කැඳවීම් ලිපි යැවුවද පොත් /පොත භාර දීමට කටයුතු කර නොමැති බැවින් ඔහු /ඇය සඳහා ඔබ ඇපකරු වී ඇති බැවින් අදාල වටිනාකම ඔබගෙන් අය කර ගැනීමට සිදුවන බව දන්වමි.

ලේකම්

.. . . . . . . . . . . . .. ප්‍රාදේශීය සභාව

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.25. මැණික් වෙළඳ ව්‍යාපාරිකයින්ගෙන් මුදලක් අය කර ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල පෙර පාසල ඉදිරිපිට මැණික් ව්‍යාපාරිකයින් සඳහා නාම පුවරුවක් සවිකිරීමට අවසර දී ඇති නමුත් ඒ වෙනුවෙන් මාසික මුදලක් අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගාස්තු අය කිරීමට කටයුතු කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අතුරු ව්‍යවස්ථාවට ප්‍රකාරව ගාස්තු අය කිරීමට කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.26.වාහන නවතා තැබීම වෙනුවෙන් මුදලක් අය කර ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල නගරයේ නවතා ඇති කුලී වාහන (ත්‍රීවිල්,වෑන්,ට්‍රැක්ටර් සහ ලොරි රථ) සඳහා මාසික මුදලක් අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී 1988 අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ගාස්තු අය කිරීමටත් ලියාපදිංචි වාහන සඳහා ස්ටිකරයක් ගැසීමටත් මේ සඳහා නිලධාරියෙක් යොදවා කඩිනම් කිරීමත් සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1988 අතුරු ව්‍යවස්ථාවට ප්‍රකාරව ගාස්තු අය කිරීමටත් ලියාපදිංචි වාහන සඳහා ස්ටිකරයක් ගැසීමටත් මේ සඳහා නිලධාරියෙක් යොදවා කඩිනම් කිරීමත් සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.27. 2022.10.18 දින පවත්වන මහ සභා රුස්වීමේ 05.01.17 සභා තීරණය සංශෝධන කිරීම.</u>

2022.10.18 දින පවත්වන මහ සභා රුස්වීමේ 05.01.17 සභා තීරණයට අනුව පොදු වෙළඳපොළ පිවිසුමේ වෙළදාම් කිරිම සඳහා තාවකාලික කඩකාමර 03ක් ඉදිකිරිම සම්බන්ධව එක් කඩකාමරයක් සඳහා රු.500.00ක කුලී මුදක් අය කිරිමට ගත් සභා තීරණය ජනවාරි මස

සිට එක් කඩකාමරක් සඳහා රු.1500.00ක කුලී මුදලක් අය කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.28. 2023 වර්ෂයේ සභා කටයුතු පවත්වා ගෙන යාම සඳහා කමිටු පත්කිරීම හා කාරක සභා සඳහා බලතල පැවරිම.

බිබිල ප්‍රාදේශිය සභාවේ 2023 වර්ෂයේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා පහත සඳහන් කමිටු හා ඊට සාමාජිකයන් පත් කිරිම සුදුසු බව යෝජනා කරමි.

මුදල් හා ප්‍රතිපත්ති සැකසිම පිලිබඳ කාරක සභාව

| | | |
|---|---|---|
| 1.ගරු සභාපති | - | ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා |
| 2.ගරු මන්ත්‍රී | - | බී. විල්මට් සිල්වා මැතිතුමා |
| 3. ගරු මන්ත්‍රී | - | එම්.ඒ. උබේසේන මැතිතුමා |
| 4. ගරු මන්ත්‍රී | - | කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා |
| 5. ගරු මන්ත්‍රිනී | - | ඩී.එම්. කරුණාවති මැතිතුමිය |

නිවාස හා ප්‍රජා සංවර්ධන පිලිබඳ කාරක සභාව

| | | |
|---|---|---|
| 1.ගරු මන්ත්‍රී | - | ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා |
| 2. ගරු මන්ත්‍රී | - | බී.එම්. ජයලත් බන්ඩාර මැතිතුමා |
| 3. ගරු මන්ත්‍රිනී | - | ඒ.එම්. නදීශා ජයමිණි ගුණසේකර මැතිතුමිය |
| 4. ගරු මන්ත්‍රී | - | කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා |

කාර්මික සේවා පිලිබඳ කාරක සභාව

| | | |
|---|---|---|
| 1. ගරු උපසභාපති | - | එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා |
| 2. ගරු මන්ත්‍රී | - | ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා |
| 3. ගරු මන්ත්‍රිනී | - | ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය |
| 4. ගරු මන්ත්‍රී | - | ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා |

පරිසර හා පහසුකම් පිලිබඳ කාරක සභාව

| | | |
|---|---|---|
| 1. ගරු මන්ත්‍රී | - | එච්.එම්. සරත්කුමාර මැතිතුමා |
| 2. ගරු මන්ත්‍රී | - | එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා |
| 3. ගරු මන්ත්‍රී | - | ආර්.බී. අත්තනායක මැතිතුමා |
| 4. ගරු මන්ත්‍රිනී | - | එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය |

බිබිල ප්‍රාදේශිය සභාවේ 2022 වර්ෂයේ දී යෝජනා කරන ලද කාරක සභාවල කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය බලතල හා විෂය පථය 2023 වර්ෂයේ කටයුතු පවත්වා ගෙන යාම සඳහා ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

1) <u>මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාව.</u>

(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය —

මහ සභාව විසින් තීරණය කළ යුතු ප්‍රශ්න හා කරුණු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ විෂය අංක 6 යටතේ සභාපතිගේ යෝජනා වශයෙන් සාකච්ඡාවට ගැනීම පහසු වන පරිදි, යෝජනා ස්වරූපයෙන් කොටුම්පත් කර ඉදිරිපත් කිරීමට යටත්ව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර වලට අදාළ කාර්ය හා කර්තව්‍ය මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවට පවරා දෙනු ලැබේ.

I. ප්‍රාදේශීය සභා පනතෙන් සහ වෙනත් ලිඛිත නීතිවලින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍යය වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදල් යෙදවීම පිළිබඳ නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

II. ප්‍රාදේශීය සභා අරමුදලට බැර කළ යුතු වරිපනම්, ප්‍රාදේශීය සභා පනතේ බලය ලැබී ඇති සියලුම බදු, විනෝද බදු, කුලී සහ ගාස්තු නියම කිරීමට අදාළ සභා යෝජනා පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

III. අයවැය ලේඛනය සහ පරිපූරක අයවැය ලේඛනය පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

IV. ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම පිළිබඳ පුරෝකථනය මහ සභාවට ඉදිරිපත් කිරීම.

V. ආදායම් රැස්කිරීම හා වියදම් දැරීමේ ප්‍රගතිය මහ සභාවට ඉදිරිපත් කිරීම.

VI. අයකර ගත නොහැකි ආදායම් පොතෙන් ලියා අස් කිරීමට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

VII. සභාව විසින් සෑදීම පිණිස කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථා මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

VIII. ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා වල සහ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා වල ඇතුළත් මුදල් පිළිබඳ කාරණා පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

IX. ප්‍රාදේශීය සභාව සතු දේපල බදුදීම, කුලියට දීම, බැහැර කිරීම හෝ ඒ දේපළ සම්බන්ධයෙන් වෙනත් ආකාරයකින් ක්‍රියා කිරීම සඳහා වන නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

X. ප්‍රාදේශීය සභාවට දේපල අත්පත් කර ගැනීම හෝ මිල දී ගැනීම පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

XI. වෙනත් යම් ස්ථාවර කමිටුවක් විසින් ඉදිරිපත් කරනු ලබන මුදල් හා සම්බන්ධ නිර්දේශ වාර්තා පිළිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභාවට ඉදිරිපත් කිරීම.

XII. මහා සභා රැස්වීම් සහ ස්ථාවර කමිටු රැස්වීම් කාල සටහන මහා සභාවේ අනුමැතියට වාර්තා කිරීම.

XIII. සභිකයන්ගේ දූරකථන සම්බන්ධතා පිළිබඳ කරුණු අධ්‍යනය කර වාර්තා කිරීම.

XIV. ප්‍රාදේශීය සභාව සතු පොත් පත්, ඔප්පු ලේඛන හා ලියකියවිලි වල ආරක්ෂාව සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යනය කර වාර්තා කිරීම.

XV. ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන නීති කෘත්‍ය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය නිර්දේශ කිරීම.

XVI. ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් කරුණු අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

XVII. ප්‍රාදේශීය සභාව සතු බලතල, කාර්ය හා කර්තව්‍යය කාරක සභා වලට, ලේකම්ට සහ වෙනත් නිලධාරයන් වෙත පවරා දීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම පිළිබඳව කරුණු අධ්‍යනය කර වාර්තා කිරීම.

XVIII. සභිකයින්ගේ දැනුම වර්ධනය කිරීම, සුභ සාධනය පිළිබඳ කරුණු අධ්‍යයනය කර වාර්තා කිරීම.

XIX. ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තනතුරු ඇති කිරීම හෝ යටපත් කිරීම.

XX. සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ගමන් වියදම් සහ පරිවර්තිත ගමන් වියදම්.

XXI. ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට කාර්ය පැවරීම.

XXII. ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන ඇතැම් සේවා පවත්වා ගැනීමේදී රාජකාරි වේලාවන් සහ ප්‍රමිතිය අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

XXIII. ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ සුභ සාධනය සහ පහසුකම් පිළිබඳව අධ්‍යනයනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

XXIV. ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳ පොළ සහ සති පොළ පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

(ආ) <u>පවරා දෙනු ලබන බලතල</u>

මහා සභාව විසින් තීරණය කළ යුතු වන, ප්‍රාදේශීය සභා අරමුදලෙන් වියදම් දැරීම සම්බන්ධ පහත සඳහන් බලතල, ඒ එක් එක් බලය යටතේ විශේෂයෙන් දක්වා ඇති කොන්දේසි වලට යටත් ව මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවට පවරා දෙනු ලැබේ.

I. ලිඛිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ යුතු ය. යන කොන්දේසියට යටත් ව, මුද්‍රා තැබූ ටෙන්ඩර් කැඳවීමෙන් තීරණය කරනු ලබන සේවා, භාණ්ඩ හෝ ද්‍රව්‍ය සැපයීමක දී, කිසියම් තනි සම්ප්‍රදාන කාර්යයන් සඳහා වන වියදම රුපියල් 500,000.00 නො ඉක්මවන අවස්ථාවක ටෙන්ඩරය පිරිනැමීම හෙවත් කාර්යය සඳහා බලය දීමේ බලතල.

II. ලිඛිත ටෙන්ඩර පටිපාටිය අනුගමනය කළ යුතු ය යන කොන්දේසියට යටත් ව, ප්‍රාදේශීය මිල ගණන් කැඳවීමෙන් තීරණය කරනු ලබන සේවා, භාණ්ඩ හෝ ද්‍රව්‍ය සැපයීමක දී, කිසියම් තනි ප්‍රසම්පාදන කාර්යයක් සඳහා වන වියදම රුපියල් 100,000.00 නො ඉක්මවන අවස්ථාවක ටෙන්ඩරය පිරිනැමීම හෙවත් කාර්යය සඳහා බලය දීමේ බලතල.

III. ගිවිසුමෙහි වටිනාකම රුපියල් 1,000,000.00 නො ඉක්මවන අවස්ථාවක, අදාළ කාර්ය ඉටු කිරීම පිළිබඳව ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි හා නියම සම්පූර්ණ කර ඇති බවට අදාළ ගෙවීම් සඳහා අනුමැතිය දීම.

IV. ගිවිසුමෙහි වටිනාකම රුපියල් 10,000,000.00 නො ඉක්මවන අවස්ථාව, අත රැඳවුම් මුදල නිදහස් කිරීමට අදාළ පටිපාටිය හා ගිවිසුමෙහි දැක්වෙන කොන්දේසි හා නියම සම්පූර්ණ කර ඇති බවට අදාළ අත රැඳවුම් මුදල් නිදහස් කිරීම සඳහා අනුමතය දීම.

(2) **නිවාස සහ ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාව.**

(අ) පවරා දෙනු ලබන කාර්ය හා කර්තව්‍යය

මහ සභාව විසින් තීරණය කළ යුතු ප්‍රශ්න හා කරුණු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ විෂය අංක 6 යටතේ සභාපතිගේ යෝජනා වශයෙන් සාකච්ඡාවට ගැනීම පහසු වන පරිදි, යෝජනා ස්වරූපයෙන් කෙටුම්පත් කර ඉදිරිපත් කිරීමට යටත් ව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර වලට අදාළ කාර්ය හා කර්තව්‍යය නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කාරක සභාවට පවරා දෙනු ලැබේ.

i. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පොදු වැදගත් කමකින් යුත් උත්සව, සංස්කෘතික ක්‍රියාකාරකම්, ආගමික උත්සව, පොදු විනෝද කටයුතු හා ප්‍රජා පිළිගැනීම් සංවිධානය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

ii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දහම් පාසල් වල කාර්ය පිළිබඳව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

iii. ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි සහ ක්‍රීඩාගාර පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

iv. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ප්‍රජා ශාලා සහ උත්සව ශාලා ඇති කිරීම හා පවත්වා ගෙන යාම පිළිබඳව නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

v. ප්‍රාදේශීය සභාව සතු මහජන පුස්තකාල වල කටයුතු පිළිබඳව අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ පුස්තකාල කමිටුවට වාර්තා කිරීම.

vi. මහජන පුස්තකාල ආශ්‍රිතව පාඨක සමාජ ඇති කිරීම, ඒවායේ ක්‍රියාකාරිත්වය ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගෙන යාම පිළිබඳව නිරන්තර විමර්ශනය කර අවශ්‍ය නිර්දේශ පුස්තකාල කමිටුවට වාර්තා කිරීම.

vii. මහජන පුස්තකාල සම්බන්ධ කර ගනිමින් වාර්ෂික සාහිත්‍ය උත්සවය පැවැත්වීමට අවශ්‍ය නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

viii. බල ප්‍රාදේශය ඇතුළත ජීවත් වන දිළිඳු තැනැත්තන්ට උපකාර කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

ix. ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමතය ඇති ව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් වල ආර්ථික, සමාජීය හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.

x. ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමතය ඇති ව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික, සමාජීය හා සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.

## (3) කාර්මික සේවා කටයුතු පිළිබඳ කාරක සභාව.

(අ) පවරා දෙනු ලබන කාර්ය හා කාර්තව්‍යය.

මහා සභාව විසින් තීරණය කළ යුතු ප්‍රශ්න හා කරුණු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ විෂය අංක 06 යටතේ සභාපතිගේ යෝජනා වශයෙන් සලකා බැලීමට ගැනීම පහසු වන පරිදි, යෝජනා ස්වරූපයෙන් කෙටුම්පත් කර ඉදිරිපත් කිරීමට යටත්ව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර වලට අදාළ කාර්ය හා කර්තව්‍යය කාර්මික සේවා කටයුතු පිළිබඳ කාරක සභාවට පවරා දෙනු ලැබේ.

i. ප්‍රාදේශීය සභාව සතු දේපල (මාර්ග පද්ධතිය ද ඇතුළුව) පිළිබඳ සංඛ්‍යා ලේඛන යාවත්කාලීන කිරීම.

ii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්නා වීථි හා මාර්ග සම්බන්ධයෙන් සභාව වෙත පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍යය ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේදය අධ්‍යනය කර වාර්තා කිරීම.

iii. වීථි මාර්ග නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා ප්‍රසිද්ධ උද්‍යාන ආදිය නම් කිරීම පිළිබඳව පිළිවෙළින් ප්‍රාදේශීය සභා පනතේ 71, 37අ සහ 37ආ වගන්ති යටතේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රාදේශීය සභාවට නිර්දේශ කිරීම.

iv. වීථි අවහිර කිරීම, වීථි ආදියට හානි පැමිණවීම, අයුතු ඇදා ගැනීම, වීථි වල පවතින බාධා සහ ප්‍රසර්පණ ඉවත් කිරීම පිළිබඳ කරුණු අධ්‍යයනය කර වාර්තා කිරීම.

v. වීථි වල කටයුතු වලට බාධා ඇති වන ගස් සහ වීථි වල හෝ මාර්ගයේ ගමන් ගන්නා තැනැත්තන්ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති වන ගස් හෝ අතු හෝ කඳන් හෝ ශෙඩි සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කර වාර්තා කිරීම.

vi. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි වීථි මාර්ග පුළුල් කිරීම සහ නව වීථි මාර්ග ඇති කිරීම පිළිබඳව කරුණු අධ්‍යයනය කර වාර්තා කිරීම.

vii. නාගරික බල ප්‍රදේශය ඇතුළත වීථි රේඛා නියම කිරීම, වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම පිළිබඳව කරුණු අධ්‍යයනය කර වාර්තා කිරීම.

iii. වීථි වල කෙරෙන කරදර පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ නිර්දේශ වාර්තා කිරීම.

ix. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවතින අනවසර ඉදිකිරීම් පාලනය, නීත්‍යානුකූල කිරීම හෝ ඉවත් කිරීම සහ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කරුණු අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

x. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම වීථි, මාර්ග, මංමාවත්, පටු මංවල රථ වාහන ගමනා ගමන නියාමනය කිරීම, පාලනය කිරීම පිළිබඳ කරුණු අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

i. නාගරික බල ප්‍රදේශය ඇතුළත ඇතිවිය හැකි ගිනි ගැනීම් වැළැක්වීම, ගිනි නිවාරණය සහ ආසන්න පළාත් පාලන ආයතන සමඟ ඇති කර ගත යුතු එකඟතා පිළිබඳ ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපත්තිය කෙටුම්පත් කර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

xii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ඇති වන වෙනත් ආපදා අවස්ථා කළමනාකරණය සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය කෙටුම්පත් කර මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

xiii. අපදා අවස්ථා කළමනාකරණය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ මහජනතාව වෙත පෙරහුරු අභ්‍යාස පැවැත්වීම පිළිබඳව ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩිදුරටත් අවශ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාවට වාර්තා කිරීම.

(4) <u>පරිසරය සහ පහසුකම් පිළිබඳකාරක සභාව.</u>

(අ) පවරා දෙනු ලබන කාර්ය හා කාර්තව්‍යය.

මහ සභාව විසින් තීරණය කළ යුතු ප්‍රශ්න හා කරුණු සම්බන්ධ නිරීක්ෂණ හා නිර්දේශ මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ විෂය අංක 6 යටතේ සභාපතිගේ යෝජනා වශයෙන් සාකච්ඡාවට ගැනීම පහසු වන පරිදි, යෝජනා ස්වරූපයෙන් කොටුම්පත් කර ඉදිරිපත් කිරීමට යටත්ව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර වලට අදාළ කාර්ය හා කර්තව්‍යය පරිසරය සහ පහසුකම් පිළිබඳ කාරක සභාවට පවරා දෙනු ලැබේ.

i. නාගරික බල ප්‍රාදේශය ඇතුළත කසළ ජනනය අවම කිරීම, කසල ජනනය වන ස්ථානයේදීම වෙන් කිරීම, කසල රැස්කිරීම, ප්‍රවාහණය කිරීම, පිරියම් කිරීම, අවසන් බැහැර කිරීම සහ කානු පවිත්‍ර කිරීම පිළිබඳ ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කලින් කල අවශ්‍යතාව අනුව වෙනස් කිරිම හා සංශෝධනය කිරීමට අදාළ නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

ii. මහා සභාව විසින් අනුමත කළ ප්‍රාදේශීය සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිරන්තර අධීක්ෂණය කිරීම සහ ප්‍රගතිය සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

iii. සභාව විසින් රැස් කරනු ලබන ඇතැම් අපද්‍රව්‍ය නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රමවේදය අධ්‍යනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

iv. ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන සුසාන භූමි හා ආදාහනාගාර වල ක්‍රියාකාරිත්වය නිරන්තර අධීක්ෂණය කරමින් ප්‍රගතිය වාර්තා කිරීම.

v. සුසාන භූමි හා භූමදාන ආඥා පනතතු මඟින් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ වාර්තා කිරීම.

vi. සුසාන භූමි අලංකරණය සඳහා නාගරික බල ප්‍රදේශයේ බහු ජන සංවිධාන සම්බන්ධ කර ගැනීම සහ ක්‍රියාත්මක වීම.

vii. නාගරික බල ප්‍රදේශය ඇතුළත සිදුකෙරෙන ක්‍රියාකාරකම් හේතුවෙන් ජනතාවගේ සෞඛ්‍යයට හා යහපාරක්ෂාවට ඇතිවිය හැකි බලපෑම් අධ්‍යයනය කර, ඒ ක්‍රියාකාරකම් විධිමත් කිරීම හා පාලනය කිරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර මහා සභාවට වාර්තා කිරීම.

viii. බල ප්‍රදේශය ඇතුලත පිහිටි වැසිකිලි හා වසුරු වලවල් විධිමත් කිරීමට අවශ්‍ය නිරික්ෂණ හා නිර්දේශ මහසභාවට වාර්තා කිරිම.

ix. නාගරික ප්‍රදේශයේ වැසිකිළි වලවල් හිස් කිරිමට අවශ්‍ය ගලි බවුසර් සේවා පවත්වා ගෙන යාම සහ ගාස්තු අය කිරිම පිලිබඳ නිරීක්ෂණ හා නිර්දේශ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහ සභාවට වාර්තා කිරිම

x. බල ප්‍රදේශය ඇතුලත පැතිර යන ආසාදන රෝග සහ වසංගත රෝග මර්ධනය කිරිමට අවශ්‍ය වැඩ පිළිවෙළ අධ්‍යයනය කර නිරීක්ෂන නිර්දේශ මහ සභාවට වාර්තා කිරිම.

xi. මදුරුවන් සහ රෝග කාරක වෙනත් කෘමින් හා සතුන් බෝවිම,එමඟින් රෝග බෝවිම පාලනය සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ අධ්‍යයනය කර නිරීක්ෂණය හා නිර්දේශ මහ සභාවට ඉදිරිපත් කිරීම.

xii. මහජන පීඩා වැලැක්විම පිණිස අවශ්‍ය වැඩපිළිවෙල අධ්‍යයනය කර මහසභාවට නිර්දේශ කිරීම.

xiii. නිවාසවල ඇති කරනු ලබන සහ දඩාවතේ යන සුනඛයන් එන්නත් කිරිම, සුනඛ ගහනය පාලනය කිරිම හා ජලභීතිකා රෝගය පාලනය කිරිම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙල අධ්‍යයනය කර මහ සභාවට වාර්තා කිරිම.

xiv. මාතෘ හා ළමා සෞඛ්‍ය ප්‍රවර්දනය කිරිම, ජනතාවගේ සෞඛ්‍ය හා සනිපාරක්ෂාව ආරක්ෂා කිරීමට අවශ්‍ය වැඩපිළිවෙල අධ්‍යයනය කර මහ සභාවට වාර්තා කිරිම.

xv. දේශීය හා බටහිර වෛද්‍ය සායන පැවැත්විම පිළිබඳ නිර්දේශ මහ සභාවට වාර්තා කිරිම.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.29. වියදම් ගෙවීම් සීමා අනුමත කර ගැනීම.

බිබිල ප්‍රාදේශිය සභාවේ එදිනෙදා කටයුතු සිදු කිරීමේ දී දරණ ලද වියදම් ගෙවීමේ දී එම ගෙවීම් සීමා අනුමත කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | විස්තරය | අනුමැතිය |
|---|---|---|
| 01 | රු.100,000.00 | ගරු සභාපතිතුමාගේ අනුමැතිය |
| 02 | රු.100,000.00ත් රු.500,000.00 | මුදල් ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය |
| 03 | රු.500,000.00ට වැඩි | ගරු සභාවේ අනුමැතිය |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02. ගරු මන්ත්‍රී එම්.ජී.පුන්සඳ විජය කුමාර මැතිතුමා

## 05.02.01.සංවර්ධන යෝජනා.

බිබිල ප්‍රාදේශීය සභාවේ මදුරුවන් පලවා හරින දුමායන පොගින් මැෂින් එක ගාස්තුවක් අය කරගෙන භාහිර පාර්ශවයට ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී පැයකට වැය වන මුදල තීරණය කිරීමට තෙල් සඳහා වැය වන වියදම කාර්මික නිලධාරී මඟින් ලබා ගත යුතු අතර, ශ්‍රම පිරිවැය හා මහජන සෞඛ්‍ය පරීක්ෂක යොදා කෙමිකල් සඳහා වැය වන වියදම තීරණය කළ යුතු අතර මේ කාරණා තුනට වැය වන මුදල සොය බලා පැයකට වැය වන මුදල තීරණය කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පැයකට වැය වන මුදල තීරණය කිරීමට තෙල් සඳහා වැය වන වියදම කාර්මික නිලධාරී මඟින් ලබා ගත යුතු අතර, ශ්‍රම පිරිවැය හා මහජන සෞඛ්‍ය පරීක්ෂක යොදා කෙමිකල් සඳහා වැය වන වියදම තීරණය කළ යුතු අතර මේ කාරණා තුනට වැය වන මුදල සොය බලා පැයකට වැය වන මුදල තීරණය කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02.02.සංවර්ධන යෝජනා.

උඩු බුබුල විවේකාගාරයෙන් වාර්ෂිකව ප්‍රාදේශීය සභාවට ලැබෙන ආදායම අඩු බැවින් නිවාඩු නිකේතනයක් ලෙස මෙම උඩු බුබුල විවේකාගාරය අලුත්වැඩියා කර රාජ්‍ය ආයතනවලට මෙන්ම ප්‍රාදේශීය සභාවට ද නිවාඩු නිකේතනයක් ලෙස යොදා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී විවේකාගාරය නිවාඩු නිකේතනයක් ලෙස සකස් කිරීමට අදාල ඇස්තමේන්තුව සකස් කර ඉදි කිරිම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

විවේකාගාරය නිවාඩු නිකේතනයක් ලෙස සකස් කිරිමට අදාල ඇස්තමේන්තුව සකස් කර ඉදි කිරිම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් මූලාසනය විසින් සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.

2022 දෙසැම්බර් මාසයේ මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදි.
එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබූනේ බිබිල ප්‍රාදේශීය සභා කොම්පෝස්ට් අලෙවිසැල හා රියදුරු විවේකාගාරය, ගබඩාව ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. රු.236715.00 ක මුදලක් ඌව රෝයල් ට්‍රේඩින් පුද්ගලික සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA -5164 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රයට හයිඩ්‍රොලික් ඔයිල් යොදා වාරසේවා කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.203553.22 ක මුදලක් ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් පුද්ගලික සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභා ජල ගබඩාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.258463.84 ක මුදලක් St. Anthony's Industries Group (Pvt) Ltd ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරිම,2023 වර්ෂයට අදාල සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීම පුවත්පත්වල පල කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.108770.75 ක මුදලක් The Associated News Papers of Ceylon Ltd වෙත ගෙවීමට නිර්දේශ කිරිම,බිබිල ප්‍රාදේශීය සභා නායකදූර ජල යෝජනා ක්‍රමය අසල නල ළිඳට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.491375.00 ක මුදලක් පූඩ් සුනිල් අප්පුහාමි මහතා වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් ZA-5419 අංක දරණ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය අලුත්වැඩියා කිරිම හා වාරසේවා කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.276800.00 ක මුදලක් J. S. B. ට්‍රේඩින් පුද්ගලික සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභාවට එරෙහිව මොණරාගල පළාත් බද මහ අධිකරණයේ පැවැත්වෙන නඩු 15 ක් සඳහා නඩු ගාස්තු වලින් කොටසක් ගෙවීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු. 263000.00 ක මුදලක් T. U. S. K. බණ්ඩාර මහතා වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපි ගොනු කවර 1000 ක් මුද්‍රණය කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු. 147500.00 ක මුදලක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය වෙත ගෙවීමට නිර්දේශ කිරිම,නිල්ගල තල්ලන්ද තොටුපල මාර්ගය කුට්ටිගල් ඇල්ලීමේ ව්‍යාපෘතියට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු. 366877.58 ක මුදලක් හැළැඹ එක්සත් ගොවි සංවිධානය වෙත ගෙවීමට නිර්දේශ කිරිම,බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු කලාපය තුල 2022.12. 13,14,15,16 යන දිනයන්හි හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීමේදී ලැබුණු වරෙන්තු ගාස්තුව ලෙස රු. 26430.23 ක මුදල එම වැඩසටහන සඳහා සහභාගි වූ නිලධාරින් හට ලබා දීමට නිර්දේශ කිරිම, රදලියද්ද පොදු සුසාන භූමියේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සහ අත්වැට සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය බිබිල ප්‍රාදේශීය සභාව මගින් ලබා දුන් අතර ඊට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.452600.00 ක මුදලක් ඌව රෝයල් ට්‍රේඩින් ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරිම, බිබිල ප්‍රාදේශීය සභා කාර්යාලයේ කාර්මික අංශය වෙන් කිරීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.158910.00 ක මුදලක් අසිත ග්ලාස් හවුස් ආයතනය වෙත ගෙවීමට

නිර්දේශ කිරීම හා බිබිල ප්‍රාදේශීය සභාවට අයත් සතොස ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීමට අවශ්‍ය තීන්ත ලබා ගැනීමට අදාල බිල්පත වෙනුවෙන් මුදල් ගෙවීම. රු.119975.00 ක මුදලක් පැමාරා කලර් ලැබ් යන ආයතනය වෙත ගෙවීමට නිර්දේශ කිරීම සුදුසු බවයි. එහි දී මන්ත්‍රී මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.

ඉදිරිපත් වී නැත

## 08.වෙනත් කරුණු

## 08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.

ගරු මන්ත්‍රී ඒ.එම්.සුදුනිලමේ මැතිතුමා වෛද්‍ය හේතුන් මත මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

### ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්විම.

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් මහජන ක්‍රීඩාංගනය පිළිබඳ ප්‍රගතිය පිළිබඳ දැන ගැනිමට කැමති බවත් එහි සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන්කල රුපියල් ලක්ෂ 50ට අදාල වැඩ කර ඇත්තද යන්නත් ස්වයං රැකියා සඳහා ලබා දී ඇති කුටි ස්ථාන ගත කිරීමේදී ප්‍රමිතියකින් යුතුව සිදු කරමින් මිනිසුන් අපහසුතාවයට පත් නොකරන ලෙස පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

### ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දැක්විම.

ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දක්වමින් සතොස ගොඩනැගිල්ලේ පිටුපස ඇති පස් ඉවත් කර අඹේලන්ද කොට්ඨාසයේ දොඩම්ගොල්ල කරදකැටිය යන මාර්ගයට දමා දෙන ලෙසත් වොලිබෝල් කෝඩ් එකෙහි වැඩ කඩිනමින් සිදු කරන ලෙසත් පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

### මූලාසනය

ගරු මූලාසනය විසින් පිළිතුරු කථාව කරමින් ගරු මන්ත්‍රී එම්.ජී.පුන්සඳ විජය කුමාර මැතිතුමාගේ කතාවට පිළිතුරක් ලෙස මූලිකවම ක්‍රීඩා පිටිය වටේ කානු කපා සකස් කල බවත් එහි පස් තට්ටුව ඉවත් කර නැවත පස් පුරවා තැලීම පළමු පියවරයේ දී සිදු කල බවත් ඉන්පසුව නැවත නැවත පස් දමා තලා තණකොළ දැමීම සුදුසු බවත් පිට අයට ක්‍රීඩාංගනය ලබා නොදෙන

බවත් ඉල්ලීම් කරන අයට ක්‍රීඩාපිටිය ලබා ගැනීමේ දී ගැටළුවක් ඇති වුවහොත් ඉල්ලීම් කරන අයට එහි වගකීම භාර දෙන බවත් ඒ සඳහා රු.25000ක ඇප මුදලක් තබා ගන්නා බවත් මීළඟ අදියරයේදී වලවල් ටික පුරවා ලෙවල් කර තණ කොල දැමීම සුදුසු බවත් ඉතිරි කාණුවල ආවරණ කොන්ක්‍රීට් එක යෙදිය යුතු බවත් ජංගම කුටි ස්ථාන ගත කිරීමේදී ආදායම් පරීක්ෂකගේ නිර්දේශය මත ක්‍රියා කරන බවත් පැවසීය. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා පැවසූ ආකාරයට සතොස ගොඩනැගිල්ලේ පිටුපස ඇති පස් පොල පිටුපසට හා ක්‍රීඩාපිටියට පස් පිරවීමට තීරණය කර ඇති බවත් ඉතිරි පස් මාර්ගවලට දැමීම සුදුසු බවත් ලැබුවා වූ වසර කිරියෙන් පැණියෙන් ඉතිරෙන සෞභාග්‍යමත් නව වසරක් වේවා යන්න ප්‍රකාශ කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

මීළඟ මාසික සභාව 2023 පෙබරවාරි මස 07 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත්
01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.